# ලංකාවේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ඇත්ත කතාව

මේ දවස්වල සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථාබහ මතුවෙලා තියෙනවා. මන් මේ තීරුව තුළ මතු කළා විරුද්ධ පක්ෂය තුළත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී විකල්පයක් ගොඩනගන්න පුළුවන් වෙයිද කියල.

දැන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ මොකක්ද කියල අපට කල්පනා කරන්න වෙනවා. මොකද? එක එක අය මේ ගැන කථා කරන නිසා.

මංගල සමරවීර මැතිතුමා මේ ළඟදි පුවත්පතකට මෙහෙම කියල තිබුණා. ".....මේ කථා කරන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මයන් තියෙන්නේ අපේ කණ්ඩායම තුළ පමණයි. එම මුලධර්ම තුළ තමයි අද එක්සත් ජාතික පක්ෂයත් ක්‍රියා කරන්නේ කියල අපි දන්නවා. ඒ නිසා එ.ජා.ප. යට එකතුවීමට මේ මොහොතේ කිසිදු බාධාවක් නෑ. ......".

මේ කථාව බැලුවාම මට කල්පනා වුණා මේ අපි එකම දේ ගැනද කතා කරන්නේ කියල. මොකද? සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් හැටියට තමා මාක්ස් එංගල්ස් වුණත් පුළුල් ජනතාව අතරට ආවේ.



යුරෝපය පුරාම ඇති වූ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ හැම එකක්ම මේ මුල් අරමුණේ ඉඳල වර්ධනය වුණ පක්ෂ. ඒවා පසු කලෙක ධනපති පක්ෂ වුණත් මුල් කාලයේදී කටයුතු කළේ වැඩකරන ජනතාව මත පදනම් වුණ විප්ලවකාරී පක්ෂ ලෙසටයි.

රුසියාවේ ලෙනින් බලයට ආවෙත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ වැඩි කණ්ඩායම හැටියටයි. ඒත් එවැනි විප්ලවකාරී අර්ථයක් නම් මේ නූතන සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ට දෙන්න අමාරුයි.

ඒත් ඉතාම පැහැදිලි කරුණු දෙකක් මේ පක්ෂවල නාමපුවරු වලත් ලොකුවට සඳහන් වෙනවා. එකක් තමයි ප්‍රජාතන්ත්‍රවාදය, මොන මට්ටමකින් හෝ ප්‍රජාතන්ත්‍රවාදී ඉඩ ලබාගැනීම වෙනුවෙන් වැඩ කටයුතු කරනවා කියන එකයි ඒකේ තේරුම.

නූතන ධනපති ලෝකය තුළත් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ විවිධ ගැටළු තියනවා. ඇමරිකාවේ ජනාධිපති තරගයකදී පිළිගත හැකි ප්‍රමාණයකට ජනතාව ඡන්දයට මැදිහත් වුණේ මේ පසුගිය ඔබාමා තරඟ කළ ඡන්දයේදීයි කියල සමහරු හෙළි කරනවා.

ඒ අනුව මහ ලොකු ප්‍රජාතන්ත්‍රවාදය කිව්වට ඒක ඇත්තටම බහුජනතාව මැදිහත් නොවන උනන්දුවක් නැති එකක් ලෙසට ක්‍රියාත්මක වෙනවද කියන ප්‍රශ්නය තියෙනවා.

ඒත් ඡන්දවලදි එහෙම වුණත් ඇමරිකාවේ යම් වැදගත් ප්‍රශ්නවලදි බලපෑම් දැමීම උදෙසා සමහර විට ලක්ෂ ගණන් පෙළපාළිවලට එකතු වෙලා ක්‍රියා කරන්න අවස්ථාව තියෙනවා. මෙවැනි මහජන බලපෑම් ඇති කිරීම ලොකු අයිතියක් හැටියටත් සලකනවා.

ඒ අනුව බැලුවහම ප්‍රජාතන්ත්‍රවාදය මාන ගණනාවකින් විහිදිලා පැතිරිලා යන්න පුළුවන්. ජාති, කුල, ආගම් අනුව සිදු වන වෙනස්කම් නැති කිරීමට, නැත්නම් නැති කිරීමට පියවර ගැනීමත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ලක්ෂණයක්.

අනෙක් අතට සම්ප්‍රදායිකව තිබෙන කාන්තාවන්ට හා දරුවන්ට තිබෙන සීමාවන් වෙනස් කිරීම හෝ නවීන කිරීමත් ප්‍රජාතන්ත්‍රවාදී ගමනක ලක්ෂණයක්.

උගත් ශීලාචාර සමාජයක්, අකුරු දන්න ඇත්ත නැත්ත සොයා බැලීමේ ආම්පන්න ලබාගත හැකි සමාජයක් ඇති කිරීමත් ප්‍රජාතන්ත්‍රවාදී ගමනේ පියවරයන්.

මේ විදියට මාන ගණනාවකින් ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්නට ඉඩ තියෙනවා. ඡන්ද බලය මේ ගමනේදී ඉතාම වැදගත් වුණත් සර්ව ජන ඡන්දයම පමණක්ම නෙවෙයි ප්‍රජාතන්ත්‍රවාදය කියන එක අවධාරණය කිරීම වැදගත්.

සර්ව ජන ඡන්දය ගැන අවධාරණය කරමින් මහ ජාතිය විසින් කුඩා ජාතිකයන් යට කරගෙන සිටීම ප්‍රජාතන්ත්‍රවාදය මරා දැමීමක්.

මහ ජාතියට පක්ෂව වැඩි ඡන්ද ප්‍රමාණයක් ගන්න පුළුවන්. ඒ ඉඩකඩ හැම වෙලේම තියෙනව. ඒ අනුව සුළු ජාතියට අයිතිවාසිකම් නැති වෙන තීන්දුවක් වැඩි ජනතාවක් සම්මත කරගතහොත් ඒ උඩ ප්‍රජාතන්ත්‍රවාදය ගැනම විශ්වාසය බිඳ වැටෙනවා.

එතකොට සිදු වෙන්නේ වෙනත් ක්‍රියාමාර්ග වලින් යුක්තිය ඉටු කරගන්නට යොමු වීමයි. මේ නිසා සෑම ජනකොටසක්ම උනන්දුවෙන් තීන්දු ගැනීමට සහභාගී වෙන, සහභාගී කරගත හැකි තත්ත්වයක් ප්‍රජාතන්ත්‍රවාදය හැටියට සලකන්න වෙනවා.

එතකොට මේ ඒකාධිපති ව්‍යවස්ථාව ගෙනාපු එක තවදුරටත් යම් ආකාරයකින් පවත්වාගෙන යන්න උත්සාහ කරන එක්සත් ජාතික පක්ෂය ප්‍රජාතන්ත්‍රවාදීද කියන ප්‍රශ්නය මතුවෙනව.

එදා 13 වෙනි ව්‍යවස්ථා සංශෝධනය වගේම, 17 වන ව්‍යවස්ථා සංශෝධනයත් ගෙන ඒමට පියවර ගැනීම ප්‍රජාතන්ත්‍රවාදී වුණත්, දැන් එයට වඩා දෙයක් කරන්න රනිල් ලෑස්ති නැති බවයි පෙනෙන්නේ.

ඊළඟට අපට විමසන්නට වෙන්නේ සමාජ කියන වචනයේ අරුතයි. එයින් සමාජ අරගලයත් පණ ගැන්වෙනවා. අදට නියමිත සමාජ අරගලය වැඩ කරන ජනතාවගේ අරගලයයි.

එහෙම නැතිව රදළ විරෝධී නැත්නම් වැඩවසම් විරෝධී කියල සමාජ අරගලයක් නෑ. යම් සංස්කෘතික ප්‍රජාතන්ත්‍රවාදී අරගලයක් ඉතිරි වෙලා තිබුණත් පැරණි ඉඩම් අයිතීන්, නින්දගම්, වාහල්කම් ආදිය දැනටමත් නීතියෙන් තහනම් කරල, අහෝසි කරල තියෙන්නේ.

එහෙම නම් සමාජ අරගලය කියල මංගල වැනි ඇත්තෝ කල්පනා කරන්නේ මොකක්ද කියල ගැටළුවක් ඇති වෙනවා. යම් සමාජ සමානාත්මතාවය පිළිබඳ අදහසක් ඒ උදවියට ඇති.

එවැනි සමානාත්මතාවය, ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් ඇත්තටම ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රශ්න මිසක සමාජ අරගලයක ප්‍රශ්න නෙවෙයි.

ඒ නිසා සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා නොකර නිකම්ම ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කළා නම් ඉවරයි.

ඇත්තටම ඒ වගේ අදහසක් උඩ වෙන්න ඕනෑ ජනරාල්තුමා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය කියල අලුත් පක්ෂයක් ගොඩනගන්න කියල උත්සාහ කරන්නේ.

දෙමළ ජනතාවගේ අයිතීන් ගැන හිතන්න තරම් විවෘත මනසක් ජනරාල්තුමාට නැති වුණත්, සිංහල සමාජය තුළ සමානාත්මතාව ගැන දැනුවත්ව මේ පක්ෂය ගොඩනගන්නට කටයුතු යොදනවා වෙන්න ඇති.

මේ විදියට කල්පනා කරන්න ජනතා විමුක්ති පෙරමුණටත් පුළුවන්නේ. ඒ ඇත්තෝ සිංහල සමාජය තුළ ඉතා තදින් සමාජ අරගලය වෙනුවෙන් වෙලාවකට පෙනී ඉන්නවා.

ඉඳල හිටලා සමාජවාදය ගැනත් කතා කරනවා. හැබැයි දෙමළ සමාජය තුළ තිබෙන මිනිස් අවයිවාසිකම් ප්‍රශ්නයට විවෘතව බහින්න උන්දැලාට බෑ.
ඒ තරමට සුළු ධනේශ්වර ජාතිවාදී රෝගය ඒ අයට වැළඳිලා. මේ අනුව යූ.ඇන්.පී. යට වඩා ප්‍රජාතන්ත්‍රවාදී විසඳුම් ජනතා විමුක්ති පෙරමුණට ලබා දෙන්න බෑ.

ඒ අය කැස්ට්‍රෝ ගැන මාක්ස් ගැන කොච්චර කථා කළත්, අද වෙනකල් කරපු දේශපාලනය නම් රූසෝ, වෝල්ටෙයාර් ගේ ඉගැන්වීම් තලයටවත් ආවේ නෑ. මේ තමා ලංකාවේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ඇත්ත කතාව.